ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ උධ්‍යයන උපාධි පාඨමාලාව - සිව්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2009
සාර්ව ආර්ථික විද්‍යාව - MCU 2207

කාලය : පැය තුනයි

දිනය: 07.02.2009 වේලාව : ප. ව. 9.30 – මධ්‍යහන12.30

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු ලියන්න.
වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

1 (i) ආර්ථික වෘධිය, පූර්ණ සේවා නියුක්තිය සහ මිල ස්ථායිකරණය වැනි ගැටළු ආර්ථික විද්‍යා විශ්ලේෂණයේදී අතිශයින් වැදගත් වේ. මේවා එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

(ii) රටක ආර්ථික වෘධිය කෙරෙහි කුමන සාධක බලපායිද? ඉහල වෘධියක් ලගා කර ගැනීමේදී රජයේ භූමිකාව කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

2. (i) ආන්තික පාරිභෝගික නැම්යාව සහ ආන්තික ඉතුරුම් නැම්යාව ප්‍රභේධනය කර දක්වන්න.

(ලකුණු 03)

(ii) කල්පිත ආර්ථිකයට අදාළ පහත තොරතුරු සළකන්න

පරිභෝජන (C) $= 60 + 0.7Yd$
ආයෝජන (I) $= 120$
රජයේ වියදම් (G) $= 60$
බදු (T) $= 35$

a. ජාතික ආදායම් සමතුලිතය ගණනය කරන්න. (ලකුණු 4)

b. වියදම් ගුණකය කුමක්ද? (ලකුණු 3)

c. රජයේ වියදම් බිලියන **30** කින් ඉහල ගියේ නම් ජාතික ආදායමේ වෙනස කුමක් වේද? (ලකුණු 2)

d, "ආයෝජන ගුණකය" සහ "රජයේ වියදම් ගුණකය" ඔබ වෙන් කොට දක්වන්නේ කෙසේද? $\Delta I = \Delta G = 40$ යැයි සිතන්න. $\Delta I$ සහ $\Delta G$ වෙන් වෙන්ව සැලකිල්ලට ගෙන ජාතික ආදායමේ වෙනස ගණනය කරන්න. (ලකුණු 5)

e. ඉහත බදුවලට අමතරව රජය විසින් 0.1y ක උපයන විට බද්දක් පැන වූයේ නම් නව ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 3)

3. (i) ආර්ථිකයක සිව් ආංශිකයන් (කුටුම්භ, ව්‍යාපාරික, රජය සහ අන්තර්ජාතික) අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කරන්නේ කෙසේ දැයි පහදන්න. (ලකුණු 08)

(ii) අන්තර් ජාතික වෙළදාම රටක ජාතික ආදායම් මට්ටම කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි ප්‍රස්ථාරයක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(iii) රටක දේශීය ආනයනයන්ගේ ඇති වන වෙනස්කම් දේශීය අපනයන කෙරෙහි කෙසේ බලපාන්නේ දැයි පහදන්න. (ලකුණු 06)

4. (i) තෙල් මිල ඉහල යාම වැනි සැපයුම් කම්පනයන්ගෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වන කෙටිකාලීන සහ දිගුකාලීන බලපෑම් මොනවාද? (ලකුණු 10)

(ii) සඵල උද්ධමන මර්ධනය කිරීමක් සඳහා උද්ධමන විරෝධී පිස්කල් ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. මෙම පිස්කල් ක්‍රියාමාර්ග මොනවාදැයි පැහැදිලි කර ඒවා උද්ධමනය මර්ධනය කිරීම සඳහා යොදා ගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. (i) විස්තරාත්මක පිස්කල් ප්‍රතිපත්තීන් ජාතික ආදායම කෙරෙහි කෙසේ බලපාන්නේ දැයි IS/LM විශ්ලේෂනය ඇසුරින් පෙන්වන්න. ජාතික ආදායම වෙනස් වන ප්‍රමාණයට කුමන සාධක බලපාන්නේද? පිස්කල් ප්‍රතිපත්තියක නිශ්චිත බලපෑම පුරෝකථනය කිරීම දුෂ්කර වන්නේ මන්ද? (ලකුණු 12)

(ii) "තෙරපුම් ප්‍රතිවිපාකය" යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 08)

6. (i) "වාණිජ බැංකු තම ව්‍යාපාරික කටයුතු තුලින් මුදල් මැවීම සඳහා දායක වේ. කෙසේ වෙතත් මෙම මුදල් මැවීමේ කියාවලියෙහි යම් සීමාවන් පවතී" උචිත උදාහරණ උපයෝගී කර ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 12)

(ii) ඉතුරුම් අනුපාතය පහල යාමෙන් සංවර්ධණය වෙමින් පවතින රටවලට ඇතිවන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

7. පහත පකාශණ වල සත්‍ය අසත්‍යතාවය විමසා ඔබේ පිළිතුර සනාථ කරන්න.

(i) "ජාතික ආදායම් ඇස්තමේන්තු අඩුලුහුඩුතා පැන නගිනුයේ යොදා ගනු ලබන දත්ත වල පවතින අවිශ්වාසනීය භාවය නිසාම පමණී"

(ii) "බොහෝ රටවල පෞද්ගලික ඉතුරුම් විශාල පරිමානයෙන් ඇද ගැනීමේ එකම මුල්‍ය මාධ්‍යය බැංකු ක්‍රමයයි "

(iv) "සේවා නියුක්තියේ පිරිවැය අප සියළු දෙනාටම දැරීමට වේ"

(v) "ව්‍යාපාරික චක්‍රයෙහි නිර්වචනයට අනුව එය සමස්ථ ආර්ථික ක්‍රියාවලිය තුල නැවත නැවත ඇති වන විස්ථාරණ සහ සංකෝචන වලින් සංයුක්තය "

(ලකුණු 05 x 4)

= හිමිකම් ඇවිරිණි =